කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2015

සැප්තැම්බර් - 2020

**BMGT E 1065 - තොරතුරු තාක්ෂණය**

කාලය : පැය 03 යි

**උපදෙස් :-**

- මෙම ප්‍රශ්න පත්‍රය I කොටස සහ II කොටස යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන පිළිතුරු පත්‍රයේම යටින් ඉරක් ඇඳ සලකුණු කරන්න.
- II කොටසෙහි රචනා ශෛලියේ ප්‍රශ්න පහක් (05) ඇතුලත් වන අතර ඉන් කැමති තුනක් (03) තෝරාගෙන ලබා දී ඇති පොත් පිංචෙහි පිළිතුරු සපයන්න.
- විභාග අපේක්ෂකයන්ට I කොටසෙහි කිසිඳු කොටසක් පිටපත් කිරීමට හෝ භාර නොදී රැගෙන යාමට අවසරයක් නොමැත.
- මුළු ලකුණු 100%.

## <u>I කොටස - බහුවරණ ප්‍රශ්න</u>

(01) DVD තැටියක ධාරිතාව

- අ) 3.44 MB
- ආ) 4.7GB
- ඇ) 100GB
- ඈ) 16GB

(02) ගොනු සංවිධානය වනුයේ, ................ තුලය.

ඇ) RAM

ආ) Cache

ඇ) Directories

ඈ) ඉහත කිසිවක් නොවේ.

(03) පහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ?

ඇ) වෛරස් යනු මෘදුකාංග කොටසකි.

ආ) වෛරස යනු මෙහෙයුම් පද්ධතියකි.

ඇ) අන්තර්ජාලය වෛරස් ව්‍යාප්තියට ඉඩ නොතබයි.

ඈ) වෛරස් මගින් පරිඝණකයක් තුල තොරතුරු සකස් කිරීමේ වේගය ඉහල නංවයි.

(04) වෙබ් අඩවි නිර්මාණය උදෙසා යොදා ගැනෙන විශේෂ භාෂාවක් විය නොහැක්කේ මින් කුමක්ද?

ඇ) HTML

ආ) COBOL

ඇ) Perl

ඈ) JAVA

(05) LAN යන්නෙහි අර්ථය වන්නේ:

ඇ) Live Area Network

ආ) Local And National

ඇ) Local Area Network

ඈ) Large Area Network

(06) Modem යන්න සැකසෙනුයේ;

ඇ) Modulation Demolition

ආ) Modulator Demodulator

ඇ) ඇ) සහ ආ) යන දෙකම

ඈ) ඉහත කිසිවක් නොවේ

(07) "DPI" යන්නෙහි අර්ථය වන්නේ:

අ) Dots per inch

ආ) Digits per unit

ඇ) Dots pixel inch

ඈ) Diagrams per inch

(08) පහත ඒවා අතුරින් පරිගණක භාෂාවක් නොවන්නේ,

අ) UNIX

ආ) PASCAL

ඇ) COBOL

ඈ) FORTRAN

(09) Corel Draw යනු ප්‍රසිද්ධ,

අ) පද සැකසුම් මෘදුකාංගයකි.

ආ) ග්‍රැෆික් නිර්මාණ මෘදුකාංගයකි.

ඇ) ක්‍රමලේඛන භාෂාවකි.

ඈ) ඉහත කිසිවක් නොවේ.

(10) දත්ත සමුදායක් භාවිතා වනුයේ,

අ) වාර්තාවන්හි දත්ත ගබඩා කිරීමට හා සංවිධානයට.

ආ) ලේඛණයන්හි ගබඩා කිරීමට සහ සංවිධානයට.

ඇ) ගොනු තුල ඇති වාර්තා ගබඩා කිරීමට හා වාර්තා කිරීමට.

ඈ) ක්ෂේත්‍ර තුල වාර්තාවන් ගබඩා කිරීම සහ සංවිධානය කිරීම.

11) අන්තර්ජාලයේ ආරම්භක අදියර,

අ) ARPANET

ආ) INTRANET

ඇ) WAN

ඈ) SPUTNIK

(12) "www.kln.ac.lk" හි උසස් ඩොමේන් නාමය කුමක් ද?

අ) www.kln

ආ) kln.ac

ඇ) ac.lk

ඉ) kln.lk

(13) .............................. යන්න වෙබ් මේල් (webmail) සඳහා උදාහරණයක් නොවේ.

අ) Hotmail

ආ) Outlook

ඇ) Gmail

ඉ) Yahoo Mail

(14) වෙබ් සහ විද්‍යුත් තැපෑල ආශ්‍රිතව ව්‍යාප්ත වන ආරක්ෂිත තර්ජනයක් නොවේ.

අ) Cookie Exploits

ආ) Site redirects

ඇ) Phishing

ඉ) Bogus Sites

(15) තොරතුරු, චිත්‍රක සංකලනයන්, අකුරු, හැඩ, වීඩියෝ සහ සජීවීකරණ පොදුවේ හැඳින්වෙන්නේ,

අ) Multifacet

ආ) Multiprocess

ඇ) Multimedia

ඉ) Multiprogramme

(16) පහත ධාරිතා ඒකක අතුරින් විශාලතම ඒකකය කුමක්ද?

අ) Gigabyte

ආ) Megabyte

ඇ) Kilobyte

ඉ) Terabyte

(17) පහත භාෂාව යොදා ගනිමින් වැඩකළ හැකි කේතයකට පරිවර්තනය කළ හැකිය.

අ) ස්වභාවික භාෂාව (Natural language)

ආ) පහල - මට්ටමේ භාෂාව (Low-level language)

ඇ) එකලස් භාෂා (Assembly language)

ඉ) ඉහළ මට්ටමේ භාෂා (High-level language)

(18) අන්තර්ජාලයට සම්බන්ධ වී ඇති පරිගණක හඳුනා ගන්නේ,

අ) IP ලිපින මගිනි.

ආ) විද්‍යුත් තැපැල් ලිපින මගිනි.

ඇ) දූරකථන අංක මගිනි.

ඉ) MAC ලිපිනය මගිනි.

(19) අෂ්ඨක පාදයට සම්බන්ධිත අංක පරාසය වන්නේ,

අ) 0 – 7

ආ) 0 – 9, A – F

ඇ) 0 – 9

ඉ) ඉහත කිසිවක් නොවේ.

(20) පින්තූරයෙන් පෙන්වන්නේ,

අ) Barcode

ආ) MICR

ඇ) QR Code

ඉ) ඉහත කිසිවක් නොවේ.

(මුළු ලකුණු 02 x 20 = 40)

## II කොටස - රචනා ප්‍රශ්න

(01) පරිගණකය ලොවක් වෙනස් කළ හැකි යන්ත්‍රයකි.

අ) පරිගණකයක පවතින පංචවිධ (05) ශ්‍රිතික හැකියාවන් යොදා ගනිමින් පරිගණකය නිර්වචනය කරන්න.

ආ) අද වනවිට පරිගණක භාවිතයේ අරමුණු තුනක් (03) ක් විස්තර කරන්න.

ඇ) තොරතුරුවල ලක්ෂණ පහක් (05) ලැයිස්තුගත කරන්න.

ඈ) පරිගණක තාක්ෂණයේ වාසි පහක් (05) ලැයිස්තුගත කරන්න.

**(මුළු ලකුණු 20 යි. සෑම කොටසකටම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.)**

(02) අන්තර්ජාලය, පසුගිය දශක ගණනාව තුල සන්නිවේදනය වෙනස් මගකට යොමුකළ ප්‍රබලම තාක්ෂණික මෙවලම් අතරින් එකකි.

අ) 'අන්තර්ජාලය' යන පදය නිර්වචනය කර එහි වාසි ලැයිස්තුගත කරන්න.

ආ) 'COVID - 19 නිවසටම වී ගත කළ කාලය' තුල ශ්‍රී ලංකාවේ පුද්ගලයන් තොරතුරු තාක්ෂණය යොදාගෙන නිවසේ සිට කාර්යාල කටයුතු කළ ආකාරය විස්තර කරන්න.

ඇ) අන්තර්ජාලය සහ එහි සේවාවන්හි අහිතකර බලපෑම් පුද්ගලයන්ට සහ සමාජයට බලපාන ආකාරය විස්තර කරන්න.

ඈ) පහත කෙටි යෙදුම්වලින් කියැවෙන්නේ මොනවාද?

- HTTP
- FTP
- HTML
- WWW
- VOIP

**(මුළු ලකුණු 20 යි. සියළුම කොටස්වලට සමාන ලකුණු හිමි වේ.)**

(03) අද වනවිට, පුද්ගලයන් සහ සමාජය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මත ඉතා වැඩි වශයෙන් රඳා පවතී.

අ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය කර්මාන්තය තුල පවතින රැකියා අවස්ථා පහක් (05) නම් කරන්න.

ආ) ව්‍යාපාර වර්ධනය සහ සංවර්ධනය මත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ බලපෑම විස්තර කරන්න.

ඇ) සමාජ මාධ්‍ය භාවිතය මිනිසුන්ගේ පුද්ගලික ජීවිතයට ඇති කරනු ලබන බලපෑම සාකච්ඡා කරන්න.

ඈ) 'පරිගණක අධි භාවිතය' නිසා සමාජයේ ඇතිවී ඇති සෞඛ්‍ය ගැටළු විස්තර කරන්න.

**(මුළු ලකුණු 20 යි. සියළුම කොටස්වලට සමාන ලකුණු හිමි වේ.)**

(04) පරිගණකයක් ක්‍රියාත්මක කර ගැනීම සඳහා දෘඩාංග මෙන්ම මෘදුකාංගද එකසේ වැදගත් වේ.

අ) 'පරිගණක දෘඩාංග' සහ 'පරිගණක මෘදුකාංග' යන පද නිර්වචනය කරන්න.

ආ) පරිගණක පද්ධතියක පවතින ප්‍රධාන දෘඩාංග කොටස් පහ (05) නම් කරන්න.

ඇ) ඉහත (ආ) කොටසේ නම් කරන ලද එක් එක් කොටස විස්තර කරන්න.

ඈ) පහත පරිශීලක අවශ්‍යතාවයන්ට අදාල වන මෘදුකාංගයක් හඳුනා ගන්න (ප්‍රථම කොටස ඔබ වෙනුවෙන් සිදුකර ඇත.)

| අවශ්‍යතාවය | මෘදුකාංග උදාහරණය |
|---|---|
| *උදා: වීඩියෝ නැරඹීමට* | ***VLC Media Player*** |
| i. දත්ත සමුදායක් සකස් කිරීමට | |
| ii. පින්තූරයක් වෙනස් කිරීමට | |
| iii. වෙබ් අඩවියක් නැරඹීමට | |
| iv. ඉදිරිපත් කිරීමක් සකස් කිරීමට | |
| v. ලියවිල්ලක් යතුරුලියනය කිරීමට | |

**(මුළු ලකුණු 20 යි. සියළුම කොටස්වලට සමාන ලකුණු හිමි වේ.)**

(05) පහත පද වලින් ඕනෑම පහක් (05) විස්තර කරන්න.

අ) සයිබර් ආරක්ෂාව (Cyber Security)

ආ) වළාකුළු පරිගණකකරණය (Cloud Computing)

ඇ) යන්ත්‍ර ඉගෙනීම (Machine Learning)

ඈ) ත්‍රිමාන මුද්‍රණය (3D Printing)

ඉ) IoT

ඊ) විස්තෘත යථාර්ථය (Extended Reality)

උ) කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence)

ඌ) නැනෝ තාක්ෂණය (Nanotechnology)

**(මුළු ලකුණු 20 යි. සියළුම කොටස්වලට සමාන ලකුණු හිමි වේ.)**